# ශ්‍රී ලංකාවේ දේශපාලන නායකත්ව සහ ආධිපත්‍ය රටා ඇසුරෙහි නව ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. ජේ. එස්. එස්. ද සිල්වා

දර්ශනපති 2017

# ශ්‍රී ලංකාවේ දේශපාලන නායකත්ව සහ ආධිපත්‍ය රටා ඇසුරෙහි නව ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. ජේ. එස්. එස්. ද සිල්වා

මෙම නිබන්ධනය දේශපාලන සමාජ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධි පාඨමාලාව සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨයට 2017 දී ඉදිරිපත් කරන ලද්දකි.

## අයදුම්කරුගේ ප්‍රකාශනය

මහාචාර්ය මයුර සමරකෝන් සහ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර යන අධ්‍යයන සුපරීක්ෂකවරුන්ගේ සුපරීක්ෂණය යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨය සඳහා ඉදිරිපත් කරන මෙම නිබන්ධනය සම්පූර්ණයෙන් හෝ කොටසක් වෙනත් කිසිදු විශ්ව විද්‍යාලයකට හෝ උසස් අධ්‍යාපන ආයතනයකට කවර උපාධියක් හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ඉදිරිපත්කර නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

.......................................	.....................................

ඩබ්ලිව්. ජේ. එස්. එස්. ද සිල්වා	දිනය

## සුපරීක්ෂකවරුන්ගේ ප්‍රකාශනය

පහත අත්සන් තබන මහාචාර්ය මයුර සමරකෝන් සහ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර යන අපගේ සුපරීක්ෂණය යටතේ ඩබ්ලිව්. ජේ. එස්. එස්. ද සිල්වා විසින් සම්පූර්ණ කරන ලදුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨය සඳහා ඉදිරිපත් කරන මෙම නිබන්ධනය සම්බන්ධයෙන් ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශය සත්‍ය බව මෙයින් සහතික කරමු. තවද මෙම නිබන්ධනය අදාළ උපාධිය පිරිනැමීම සඳහා ඇගයීමට ලක්කිරීමට යෝග්‍ය බව ද සහතික කරමු.

| | |
|---|---|
| ………………………… | ……………………………… |
| මහාචාර්ය මයුර සමරකෝන් | ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර |
| දිනය :…………………. | දිනය :…………………. |

## පිදුම

සමාජ විද්‍යාව නම් මහසයුරෙහි ඈත දියඹට

ප්‍රඥාව නම් නෞකාවෙන් අප රැගෙන ගොස්

අපටත් නොකියාම දිවිසුයුරින් එතෙර ගිය

කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ

හිටපු ජ්‍යේෂ්ට  කථිකාචාර්ය

ආචාර්ය නිවුටන් ගුණසිංහයන් හට

මෙම නිබන්ධනය

ගුරු පඬුරක් කොට

ඉමහත් බැති සිතින්

පිළිගන්වමි ……..

# පටුන

| මාතෘකාව | පිටුව |
| --- | --- |
| පටුන | i |
| වගු සටහන් ලේඛනය | vi |
| ස්තුතිය | viii |
| සංක්ෂිප්ත සාරාංශය | x |
| 1. පළමු පරිච්ඡේදය : හැඳින්වීම | 1 |
| 1.1.අධ්‍යයනයේ පසුබිම | 1 |
| 2. දෙවන පරිච්ඡේදය : සාහිත්‍ය විමර්ශනය | 23 |
| 2.1. ශ්‍රී ලංකාවේ දේශපාලන සමාජ විද්‍යා සාහිත්‍යය | 22 |
| 2.2. බලය සහ ආධිපත්‍යය යනු කුමක්ද? | 34 |
| 2.2.1. බලය සහ ආධිපත්‍යය පිළිබඳ මැක්ස් වෙබර්ගේ විග්‍රහය | 36 |
| 2..2.2. වාතාවරණය පිළිබඳ වෙබර්ගේ විග්‍රහය | 43 |
| 2.3. රාජ්‍ය කේන්ද්‍රීය සහ දේශපාලන ආයතනික න්‍යාය | 47 |
| 2.4. නව මාක්ස්වාදී ගුරුකුලය | 49 |
| 2.5. විචාර න්‍යාය : මැක්ස් හොක්හයිමර් | 50 |
| 2.6. ජාර්ගන් හබර්මාස් | 51 |
| 2.7. පශ්චාත් නූතනවාදී සහ පශ්චාත් ව්‍යුහවාදී න්‍යායන් | 54 |
| 2.7.1. මිෂෙල් ෆූකෝ | 54 |
| 2.7.2 හෙන්රි ලෙෆ්බෙවර් | 56 |
| 2.8. කතිකාවත් න්‍යාය | 57 |
| 2.9. පෙරී බෝර්ඩියෝ ගේ ප්‍රාග්ධනයේ ආකෘතීන් පිළිබඳ කතිකාව | 58 |
| 2.10.1. නායකත්වය සංකල්පය | 60 |
| 2.10.2.දේශපාලන නායකත්වය | 61 |
| 2.11. ප්‍රභුත්වය හා නිර්ප්‍රභුත්වය | 66 |
| 2.11.1. පරේටෝගේ ප්‍රභු සංසරණ න්‍යාය | 66 |
| 2.11.2. අන්තෝනියෝ ග්‍රාම්ස්චි | 68 |
| 2.11.3. සී. රයිට් මිල්ස්ගේ බල ප්‍රභු න්‍යාය | 70 |
| 2.11.4. ලී - බෙනීච් | 72 |
| 2.11.5. නිර්ප්‍රභු කතිකාව | 74 |

3. තුන්වන පරිච්ඡේදය : පර්යේෂණ ක්‍රමවේදය 78
3.1. පර්යේෂණ ගැටලුව සහ එහි පසුබිම 78
3.2. අධ්‍යයනයේ අරමුණු 80
3.2.1. ප්‍රධාන අරමුණ 80
3.2.2. විශේෂිත අරමුණු 80
3.3. පර්යේෂණ ක්‍රමවේදය 80
3.3.1. පර්යේෂණ නියැදිය 81
3.3.2. දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය 84
3.3.2.1. සම්මුඛ සාකච්ඡා ක්‍රමය 84
3.3.2.1.1. ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමය 85
3.3.2.1.2. සරල සම්මුඛ සාකච්ඡා ක්‍රමය 86
3.3.2.2. ප්‍රත්‍යෝයික ඉතිහාස අධ්‍යයන ක්‍රමය 86
3.3.2.3. පුස්තකාල අධ්‍යයන ක්‍රමවේදය 86
3.3.2.4. ද්වීතීක දත්ත මූලාශ්‍ර භාවිතය 87
3.3.3. පර්යේෂණ ක්‍රියාවලිය 87
3.4. දත්ත විශ්ලේෂණය 90
3.5. පර්යේෂණයේ සීමා 91
3.6. පර්යේෂණයේ ආචාර ධාර්මිකභාවය 91
4. හතරවන පරිච්ඡේදය: ප්‍රතිඵලය 93
වැඩවසම් සමාජයේ සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ දේශපාලන නායකත්වයේ සහ ආධිපත්‍යයේ ගමන් මග
4.1. රාජාණ්ඩු පාලන සමය 94
4.2. උඩරට රාජධානිය 94
4.3. පහතරට ප්‍රදේශවල යුරෝපීය ආධිපත්‍යය 97
4.3.1. පෘතුගීසි පාලන සමය 97
4.3.2. ලන්දේසි පාලන සමය 101
4.3.3. බ්‍රිතාන්‍ය පාලන සමය 102
4.4. නව යටත් විජිත ප්‍රභූ පංතිය සහ ඉඩම් අයිතිය 114
4.5. ව්‍යවස්ථාදායක සභාවේ නියෝජනය සඳහා වූ අරගලය 120
4.6. නිදහස් ශ්‍රී ලංකාවේ දේශපාලන නායකත්වයන් 123

4.6.1. ඩී. එස්. සේනානායක 123
4.6.1.2. සේනානායක පවුල් කාටලය 124
4.6.2. ඩඩ්ලි සේනානායක 127
4.6.3. ජෝන් කොතලාවල 128
4.6.4. එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක 129
4.6.4.1. බණ්ඩාරනායක පවුල් කාටලය 130
4.6.4.2. බණ්ඩාරනායක සිංහල ජාතික බලවේගයේ නායකයා බවට පත්වීම 133
4.6.5. විජයානන්ද දහනායක 137
4.6.6. සිරිමා බණ්ඩාරනායක 138
4.6.7. ජේ. ආර්. ජයවර්ධන 145
4.6.7.1. ජයවර්ධන පවුල් කාටලය 145
4.6.7.2. ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ක්‍රමයේ ආරම්භය 148
4.6.7.3. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය 150
4.6.8. ආර්. ප්‍රේමදාස 152
4.6.9. ඩී. බී. විජේතුංග 157
4.6.10. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග 159

5. පස්වන පරිච්ඡේදය : සාකච්ඡාව 162
විසිවන සියවසෙන් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන ආධිපත්‍ය සහ නායකත්ව රටාවන්ගේ වෙනස්කම් 162
5.1. මහින්ද රාජපක්ෂ 162
5.1.2. රාජපක්ෂ පවුලේ පසුබිම 163
5.1.3. මහින්ද රාජපක්ෂ බලයට පත්වීම 164
5.1.4. පෞරුෂ නායකත්ව කතිකාව 170
5.1.5. මහරාජාණෝ සංකල්පය 174
5.1.6. මහින්ද චින්තන ආර්ථික ප්‍රතිපත්තිය 179
5.1.7. මහින්ද රාජපක්ෂ පරාජයට පත්වීම 183
5.2. මෛත්‍රීපාල සිරිසේන 191
5.3. රනිල් වික්‍රමසිංහ 195
5.4. ප්‍රභූ දේශපාලන ආධිපත්‍යයේ සිදු වී ඇති වෙනස්කම් 199
5.4.1. ප්‍රභූ පංතියේ ඉඩම් ආධිපත්‍යය බිඳවැටීම 203

5.4.2. නව ලිබරල් ගෝලීය ප්‍රභූන් 206
5.5. දේශපාලන පක්ෂ සහ බලපෑම් කණ්ඩායම්වල වෙනස්වීම 207
5.6. අපැහැදිලි දෙවනපෙළ නායකත්වය 210
5.7. වාමාංශික පක්ෂ දුර්වලවීම 211
5.8. නව බලවේග හෝ අලුත් දේශපාලන පක්ෂවලට ඇති අවකාශය 214
5.9. අභඹූ ජනප්‍රිය නායකයින් / "සුපිරි තරු" නායකයින් බිහිවීම 216
5.10. නූතන තරුණ පෙළ හා ඔවුන්ගේ දේශපාලන භාවිතය 217
5.11. නූතන උගත් ලාංකිකයින්ගේ දේශපාලන භාවිතාව 219
5.12. දේශපාලන සහ මුදල් අතර ඇති ඓන්ද්‍රිය සම්බන්ධතාව 222
5.13. දේශපාලනය සහ මාධ්‍ය අතර සම්බන්ධතාව 224
5.14. නිශ්චිත මොහොත මත දේශපාලන ආධිපත්‍යයය සහ නායකත්වය තීරණයවීම 225
5.15. කැරළිකාර තරුණ නැගිටීමක් සඳහා ඇති ඉඩකඩ 228
5.16. හමුදා ආධිපත්‍යයක් ඇතිවීමේ ඉඩකඩ 229
5.17. ජාත්‍යන්තර දේශපාලන මැදිහත්වීම සහ ලංකාවේ දේශපාලන ස්වාධිපත්‍යය 231
5.18. සිවිල් සංවිධානවල දේශපාලන මැදිහත්වීම 234
5.19. සුළු ජාතිකවාදී දේශපාලන ආධිපත්‍යය 237
5.20. සන්ධාන ප්‍රවණතාව 238
5.21. සිංහල ජාතිකවාදී කඳවුර ශක්තිමත්වීම 241
5.22. 2015 ප්‍රභූ - නිර්ප්‍රභූ දේශපාලන සන්ධානය 245

6. හයවන පරිච්ඡේදය : නිගමනය 250
6.1. ආධිපත්‍යතාවාදී කතිකාවත් න්‍යාය 252
6.1.1. ජනප්‍රිය දොඩමළු කතිකාව 256
6.1.1.1. ඉතිහාසය පිළිබඳ ජනප්‍රිය දොඩමළු කතිකාව 257
6.1.1.2. ජාතිකත්වය පිළිබඳ ජනප්‍රිය දොඩමළු කතිකාව 259
6.1.1.3. ප්‍රභූ -නිර්ප්‍රභූ ජනප්‍රිය දොඩමළු කතිකාව 263
6.1.1.4 නායකත්වය පිළිබඳ ජනප්‍රිය දොඩමළු කතිකාව 272
6.2. නිශ්චිත මොහොත පිළිබඳ කතිකාව 279
6.2.1. දේශපාලන වාතාවරණය 280
6.2.2. ශ්‍රී ලංකාවේ දේශපාලන වාතාවරණය 281
6.2.3. නිශ්චිත මොහොතෙහි ත්‍රිත්ව ක්ෂේත්‍ර බලපෑම 284

6.2.3.1. පක්ෂ, සන්ධාන සහ බලපෑම් කණ්ඩායම් වලින් සැඳුම්ලත් දේශපාලන ආයතන ක්ෂේත්‍රය 285
6.2.3.2. නායකත්වය පදනම් කරගත් දේශපාලන මෙහෙයුම් ක්ෂේත්‍රය 285
6.2.3.3. ඡන්දදායකයන් ගෙන් සැඳුම්ලත් දේශපාලන ආධිපත්‍ය ක්ෂේත්‍රය 286
7. ආශ්‍රිත ග්‍රන්ථ ලේඛනය 288
8. ඇමුණුම් 300
ඇමුණුම 01 දත්තදායක නාම ලේඛනය 300
ඇමුණුම 02 සම්මුඛ සාකච්ඡා ප්‍රශ්නවලි ආදර්ශකය 305
ඇමුණුම 03 ප්‍රශ්නාවලිය කේතගත කිරීම 307
ඇමුණුම 04 උඩරට පැරණි කුල ධූරාවලීන් දෙකක් 308
ඇමුණුම 05 නිබන්ධනයේ භාවිතමය වටිනාකම 310

**වගු සටහන් ලේඛනය**


| වගු අංකය | වගුවේ නම | පිටුව |
|---|---|---|
| වගු අංක 03.01. | ප්‍රධාන ක්ෂේත්‍රවල නියැඳි නියෝජනය | 81 |
| වගු අංක 03.02. | ප්‍රධාන ක්ෂේත්‍රවල උප නියැඳි නියෝජනය | 83 |
| වගු අංක 03.03. | සමාජ දේශපාලන ක්‍රියාධර උප නියැඳි නියෝජනය | 83 |
| වගු අංක 03.04. | උගත් බුද්ධිමත් සිවිල් ක්‍රියාධරයන්ගේ උප නියැඳි නියෝජනය | 84 |
| වගු අංක 04.01. | වරුසහැන්නැඳි ජෙරෝනිස් ද සොයිසා ගේ අරක්කු රේන්දය | 107 |
| වගු අංක 04.02. | 1814 – 1841 කාලය තුළ විටින් විට බ්‍රිතාන්‍යය ආණ්ඩුවෙන් ඉඩම් ලැබූ ප්‍රභූන් පිරිසක් | 115 |
| වගු අංක 04.03. | 1829 දී කොළඹ විසූ ප්‍රධාන ඉඩම් හිමියන් | 116 |
| වගු අංක 05.01. | මහින්ද රාජපක්ෂ බලයට පත්වීම කෙරෙහි බලපෑ සාධක | 166 |
| වගු අංක 05.02. | මහින්ද රාජපක්ෂ අනුහස් නායකයෙක්ද ? පෞරුෂ නායකයෙක්ද? | 171 |
| වගු අංක 05.03. | මහාරජාණෝ සංකල්පය පිළිබඳ පර්යේෂණ නියැදියේ මතය | 176 |
| වගු අංක 05.04. | මහින්ද රාජපක්ෂ පරාජය වීමට හේතු | 184 |
| වගු අංක 05.05. | මෛත්‍රීපාල සිරිසේන ජයග්‍රහණය කිරීමට හේතු | 194 |
| වගු අංක 05.06 | ප්‍රභූ දේශපාලනයේ වර්තමානය | 201 |
| වගු අංක 05.07. | දේශපාලන පක්ෂ ක්‍රමය තුළ සිදුවී ඇති වෙනස්කම් | 208 |
| වගු අංක 05.08. | නූතන තරුණ පරපුරෙහි දේශපාලන භාවිතාව | 218 |
| වගු අංක 05.09. | නූතන උගත් ලාංකිකයාගේ දේශපාලන භාවිතාව | 220 |
| වගු අංක 05.10. | දේශපාලනය සහ මුදල් අතර ඇති සම්බන්ධතාව | 222 |
| වගු අංක 05.11. | දේශපාලනය සහ මාධ්‍ය අතර සම්බන්ධතාව | 224 |
| වගු අංක 05.12. | නිශ්චිත මොහොත පිළිබඳ සංකල්පය | 226 |
| වගු අංක 05.13 | ජාත්‍යන්තර මැදිහත්වීම සහ ලංකාවේ දේශපාලන ස්වාධිපත්‍යය | 232 |
| වගු අංක 05.14. | සිවිල්/රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ මතය | 234 |

**ස්තුතිය ...............**

මෙම පර්යේෂණ නිබන්ධනය සාර්ථකකර ගැනීම සඳහා කැපවීමෙන් හා වගකීමෙන් මඟ පෙන්වූ අධ්‍යයන සුපරීක්ෂක ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපති මහාචාර්ය මයුර සමරකෝන් සහ ඒ හා සමව නිවැරදිව මාර්ගෝපදේශකත්වය සපයමින්, දුෂ්කරතා වලදී පෙනීසිටිමින් කටයුතු කළ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර යන දෙපොළට මෙහිලා පළමුව තුති පුදමි. ඊට අමතරව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සම්පත් අමරතුංග, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ හිටපු පීඨාධිපතිණී මහාචාර්ය ස්වර්ණා පියසිරි සහ වර්තමාන පීඨාධිපතිණී මහාචාර්ය හේමන්ති රණසිංහ යන මහත්ම මහත්මීන්ට ද මෙහිලා ස්තුතිවන්ත වෙමි.

පශ්චාත් අධ්‍යයන කටයුතු කෙරෙහි මා පොළඹවමින් සහ අවැසි පහසුකම් සපයමින් නිබඳවම මා දිරිමත් කරන කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ලක්ෂමන් දිසානායක, ශාස්ත්‍ර පීඨයේ හිටපු පීඨාධිපති මහාචාර්ය අතුල රණසිංහ, වර්තමාන පීඨාධිපති මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා, සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ හිටපු අංශාධිපතිණී ආචාර්ය චාන්දනී ලියනගේ සහ වර්තමාන අංශාධිපති ආචාර්ය නිශාර ප්‍රනාන්දු යන අයට ද ස්තුතිවන්ත විය යුතුමය. සොයාගැනීමට අපහසු එහෙත් අත්‍යාවශ්‍ය වූ පොතපත සපයා දෙමින් ද අදහස් හා උපදෙස් දෙමින් ද මෙම කාර්යය සඳහා මහඟු දායකත්වයක් සැපයූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හිටපු සභාපති මහාචාර්ය ගාමිණී සමරනායක, කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ හිටපු ජ්‍යෙෂ්ට කථිකාචාරිණී ආචාර්ය රමණී ජයතිලක, මහාචාර්ය චන්ද්‍රසිරි නිරිඇල්ල, ආචාර්ය සුභාංගි හේරත්, ආචාර්ය මොහොමඩ් මහීෂ් ඇතුලු කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලයට මෙහිලා ස්තුතිවන්ත වෙමි. තවද එම කාර්යෙහිලා උපකාර කළ ජනාධිපති සම්බන්ධීකරණ ලේකම් ගිරාල් ලක්තිලක, ප්‍රවීණ මාධ්‍යවේදී වික්ටර් අයිවන් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී තුෂාරි අමරසේන යන අයට ද ස්තුතිවන්ත වෙමි. මෙම අධ්‍යයන කාර්යයෙහිලා ඓතිහාසික මූලාශ්‍ර සහ දත්ත සපයා ගැනීමට සහය දැක්වූ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ උපදේශක පුරාවිද්‍යා මහාචාර්ය කේ. ඩී. පරණවිතාන, හිටපු අධ්‍යක්ෂක ජෙනරාල් ආචාර්ය කේ. ඩී. පී. විමලරත්න සහ වර්තමාන අධ්‍යක්ෂක ජෙනරාල්වරියට සහ එහි කාර්ය මණ්ඩලයට ද නොඅඩුව තුති පුදමි. ජේ. ආර්. ජයවර්ධන

මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක නිහාල් හේවගේ සහ එහි පුස්තකාලයේ කාර්ය මණ්ඩලය, ආචාර්ය එන්. එම්. පෙරේරා මධ්‍යස්ථානය, කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර සහ පේරාදෙණිය යන පුස්තකාලවල කාර්ය මණ්ඩල වලට ද එසේම කොළඹ විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ට කතිකාචාර්ය මහේෂ් සේනානායක සහ එම අධ්‍යයන අංශයේ පුස්තකාලයේ කාර්ය මණ්ඩලයට ද සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ පුස්තකාලයේ නිශ්ශංක ඇතුලු සියලු දෙනාටම ද මෙහිදී ස්තූිවන්ත විය යුතුමය.

මෙම අධ්‍යයනය සාර්ථක කරගැනීමේලා මට විශාලතම දායකත්වය සපයන ලද්දේ මෙම අධ්‍යයනයේ දත්තදායකයින්ය. ශ්‍රී ලංකාවේ වර්තමාන ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුලු දේශපාලන අධිකාරියේ ඉහළම තනතුරු දරූ සහ දරන මැති ඇමතිවරුන්, පක්ෂ නායකයින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රජයේ උසස් නිලතල දරන සහ දැරී තැනැත්තන්, උගතුන්, බුද්ධිමතුන්, සමාජ සහ දේශපාලන ක්‍රියාධරයින්, සිවිල් සමාජ ක්‍රියාකාරිකයින් සහ වෘත්තීය සමිති නායක කාරකාදීන් මෙම කාර්යයේලා මට දැක්වූ  සහය අති විශිෂ්ටය. එබැවින් ඒ සැමට ද නොඅඩුව තුති පුදමි.

මෙම අධ්‍යයන කාර්යය සාර්ථක කරගනු වස් බොහෝ  වෙහෙසුණු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපාධිධාරිණී චමුදිතා අමරසේකර සහ කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධිධාරී අරුණ ගුණරත්න යන පර්යේෂණ සහායකයින් දෙපොළට ද ස්තුති කරමි. තවද ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ට සහකාර  ලේඛකාධිකාරී නලින්ද, මාණ්ඩලික නිලධාරිණී කුමුදුනී ඇතුලු සමස්ත කාර්ය මණ්ඩලයටත් මෙහිලා ස්තුතිවන්ත විය යුතුමය. එලෙසම කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ට සහකාර මාණ්ඩලික නිලධාරිණී රේණුකා වීරක්කොඩි සහ කේ. ඒ. නවරත්න යන මහත්ම මහත්මීන්ට ද එම අධ්‍යයන අංශයේ අනුර සහ තාරකාට ද ස්තුතිවන්ත වෙමි. මෙම අධ්‍යයන කාර්ය ආරම්භ කළ අවස්ථාවේ සිටම සම්බන්ධීකරණ  කාර්යයෙන් මට සහය දැක්වූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සහකාර කළමනාකාර විකුම් පෙරේරාට නිරෝෂා සිටුගේට ද ස්තුතිවන්ත වෙමි.

ඒ සියලු සහය පළකිරීම් එක් පසෙකය. අනෙක් පසින් ඒ හා සමව දයාබර බිරිඳ ශාලිකාගේ සහයයි. මෙම කාර්යය උදෙසා මා වෙහෙසුණු දීර්ඝ කාලය පුරාම ඇය මගේ කාලයෙන් බිඳක් හෝ නොඉල්ලුවාය. නිවසේ මෙන්ම දරුවන්ගේ වගකීම් ද ඇය තනිව කරට ගත්තාය. ඇගේ එම සහය නොවන්නට මෙම කාර්යය කිසිදා සම්පූර්ණ නොවනු ඇත. එබැවින් ඇයට වෙසෙසින් පැසසිය යුතුමය. ගීමි වැල්ලවත්ත සහ දෙව්ණි වැල්ලවත්ත යන දියණියන් ද දේශාවින්ද වැල්ලවත්ත සහ විශුධ වැල්ලවත්ත යන දෙපුතුන් ද  නිවාඩු කාල, විනෝද චාරිකා ආදී ඔවුනට හිමි මගේ කාලය කිසිවක් නොකියාම කැප කළහ. එහි ස්තුතිය ඔවුනට හිමි විය යුතුමය. ඒ සමඟම නමින් නොකියවුණු එහෙත් මෙම කාර්යයෙහිලා නන් අයුරින් සහය වූ සැමටම ස්තුති කිරීමට ද මම අමතක නොකරමි.

**‘ශ්‍රී ලංකාවේ දේශපාලන නායකත්ව සහ ආධිපත්‍ය රටාවන් ඇසුරෙහි නව ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්’**

**ඩබ්ලිව්. ජේ. එස්. එස්. ද සිල්වා**

**සංක්ෂිප්ත සාරාංශය**

ශ්‍රී ලංකාවේ දේශපාලන නායකත්ව සහ ආධිපත්‍ය රටාවන්ගේ වෙනස්කම් ප්‍රභූ, නිර්ප්‍රභූ න්‍යායික සංකල්ප ඇසුරෙන් පමණක් තේරුම්ගත හැකිද? නැතිනම් වෙනත් දේශපාලන සමාජ විද්‍යාත්මක හේතු සාධකයන්ද ඊට බලපා ඇද්ද? යන පර්යේෂණ ගැටලුව පදනම් කරගෙන මෙම අධ්‍යයනය සිදුකර ඇත. අධ්‍යයනය නියැදිය වශයෙන් රාජ්‍ය නායකයින්, පක්ෂ නායකයින් හෝ පක්ෂවල ප්‍රධාන නිලධාරීන් ඇතුළු සෘජු දේශපාලන නියෝජිතයින්, සමාජ දේශපාලන ක්‍රියාධරයින් සහ උගත් බුද්ධිමත් සිවිල් ක්‍රියාධරයින් යන අංශ තුනට අයත් 60 දෙනෙකුගේ නියැදියක් ‘‘අරමුණු සහගත න්‍යායික නියැදි ක්‍රමය’’ යටතේ තෝරා ගන්නා ලදි. දත්ත රැස්කිරීම සඳහා ප්‍රත්‍යෙයික අධ්‍යයන ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ පුස්තකාල අධ්‍යයන ක්‍රමය යොදා ගන්නා ලදි.

මෙම නිබන්ධනය තුළ දී ආනුභවික අධ්‍යයනය ඇසුරින් රැස්කරගන්නා ලද දත්ත මැක්ස් වෙබර් වැනි සම්භාවය සමාජ විද්‍යාඥයින්ගේ න්‍යායික ඉදිරිපත් කිරීම්වල සිට මිෂෙල් ෆූකෝ, පෙරී බෝර්ඩියෝ සහ හබර්මාස් වැනි පශ්චාත් නූතනවාදීන්ගේ න්‍යායික ඉදිරිපත් කිරීම් දක්වා වන පරාසයක් තුළ සාකච්ඡාවට භාජනයකර තිබේ. ඒ අනුව 1948 සිට 2016 පමණ දක්වා ශ්‍රී ලංකාවේ සිදුවන දේශපාලන ආධිපත්‍යය සහ නායකත්වය ඇසුරෙහි සිදුවී ඇති කැපී පෙනෙන වෙනස්කම් ගණනාවක් මෙහිදී සාකච්ඡාවට ලක්කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ පැවති ජාතික ප්‍රභූන්ගේ දේශපාලන නායකත්වය සහ ආධිපත්‍යයේ රටාවේ පැහැදිලි බිඳවැටීමක් සිදුවී ඇති බවත් ඒ වෙනුවට දේශීය ප්‍රභූ පංතිය හෝ නිර්ප්‍රභූ සමාජ කොටස් වෙත දේශපාලන නායකත්වය සහ ආධිපත්‍යය දෝලනය වෙමින් පවතින බව හඳුනාගෙන තිබේ. ඊට අමතරව දේශපාලන පක්ෂ ක්‍රමය දුර්වලවීම, වමේ පක්ෂ සහ සුළු පක්ෂ අභාවයට යමින් පැවතීම, සෑම පක්ෂයකම පාහේ දෙවන පෙළ නායකත්වයන් ගොඩනොනැගීම, තරුණ කොටස් පක්ෂ දේශපාලනයට ප්‍රවේශ නොවීම, මුදල් සහ මාධ්‍ය විසින් කරන බලපෑම, සිවිල් සංවිධාන සහ නූතන උගත් ශ්‍රී ලාංකිකයින්ගේ ක්‍රියාකාරීත්වය ඉහළ මට්ටමක පැවතීම වැනි වෙනස්කම් රාශියක් සිදු වී ඇති බව ද හඳුනාගෙන

තිබේ. ඒ වෙනුවට පවතින දේශපාලන වාතාවරණය පදනම් කරගෙන හදිසි සන්ධාන ගොඩනැගීම, "සුපිරිතරු නායකත්වයන්" බිහිවීම සහ ඡන්දදායකයා අවිනිශ්චිත බවට පත්වීම හෝ පාවෙන ඡන්ද ප්‍රමාණය සීඝ්‍රයෙන් ඉහළයාම ද ශ්‍රී ලංකාවේ මෑතකාලීනව සිදුවී ඇති දේශපාන වෙනස්කම් වේ.

ඒ ඇසුරින් මෙම අධ්‍යයනයේදී දේශපාලන සමාජ විද්‍යාවට "ආධිපත්‍යතාවාදී කතිකාවත් න්‍යාය" යන නව න්‍යායික ඉදිරිපත් කිරීමක් සිදුකර තිබේ. ආධිපත්‍යතා කතිකාවත් න්‍යාය යනු " කිසියම් සමාජයක පවතින අධිපති මතවාදය විසින් එම සමාජයේ ආර්ථික, සමාජ සහ දේශපාලන සංස්ථාවන් පාලනය කරනු ලැබීම පිළිබඳව පවතින නොඑකඟතාවන් සහිත සාකච්ඡා සමූහයයි". ශ්‍රී ලංකාවේ දේශපාලන නායකත්වය සහ ආධිපත්‍යය තීරණය කරන ප්‍රමුඛ ආධිපත්‍යතාවාදී කතිකාව නම් සිංහල ජාතිකවාදී මතවාදී කතිකාවයි. ඊට එරෙහි ද්‍රවිඩ ජාතිකවාදී කතිකාවක් පවතින නමුත් බොහෝ විට එම කතිකාව පවතින්නේ නව ලිබරල්වාදී කතිකාවේ අන්තර්ගතයක් වශයෙනි. මෙම න්‍යායික සාකච්ඡාවට අනුව දුටුගැමුණු එළාර යුද්ධයෙන් පසුව සිංහල ජාතිකවාදී කතිකාවේ කූඨප්‍රාප්තිය ගොඩනැගෙන 'නිශ්චිත මොහොත' එළඹෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් 'ප්‍රභාකරන්' පරාජයටපත් කිරීම නිසාය.

ආධිපත්‍යතා කතිකාවත් න්‍යාය ඇසුරෙහිම ගොඩනැගෙන තවත් දේශපාලන සමාජ විද්‍යාත්මක න්‍යායික සංකල්පය දෙකක් ලෙස "ජනප්‍රිය දොඩමළු කතිකාව" සහ "නිශ්චිත මොහොත" පිළිබඳ සංකල්පය දැක්විය හැකිය. ජනප්‍රිය දොඩමළු කතිකාව යනු එහි ලා ඉදිරිපත් කරන අදහස සත්‍යයට සමීප වුවද නැතිද අදාළ මතවාදය ආරක්ෂා කිරීම සඳහා ගොඩනැගී ඇති, පොදුවේ කතාබහට ලක්වන කතිකාව යන්නයි. නිශ්චිත මොහොත යනු බිඳවැටෙන සම්ප්‍රදායික ජාතික ප්‍රභූ ආධිපත්‍යය වෙනුවට නූතන නායකයින් බිහිකිරීම සඳහා පවතින දේශපාලන වාතාවරණය යටතේ උදා කරන අවස්ථාව යන්නයි